# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2159/52 – 2020 ජනවාරි 25 වැනි සෙනසුරාදා – 2020.01.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2001 මැයි මස 23 වැනි දින අංක 1185/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2001 අංක 185 හා 2001.05.22 වැනි දින දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත උපලේඛනයේ සඳහන් අංක KA/MTG/01/56 හා 2001.02.20 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් සම්පූර්ණ ඉඩම මෙම නියමය මගින් අවසතු කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2001/වීපී/67.
ප්‍රා. ලේකම්ගේ අංකය: මතු/ඉඅ/4/28.
2020 ජනවාරි මස 04 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", 1200/6,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉද්දගොඩ පත්තුව සුළු කොට්ඨාසයේ, වැල්කන්දල ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙළ කරන ලද KA/MTG/01/56 හා 2001.02.20 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දක්වා ඇති නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

**01. කැබලි අක්ෂර 'A' – ක්ලෝඩන්වත්තේ පාන්තිය කොටස – ප්‍රමාණය: හෙක්. 3.2990**

උතුරට: මාර්ගය, ඇල සහ අගලවත්ත වැව්ලි සමාගම හිමිකම් කියන පාන්තිය කොටස; නැගෙනහිරට: අගලවත්ත වැව්ලි සමාගම හිමිකම් කියන පාන්තිය කොටස, ඒ. ජෝන් තුඩුගලගේ හිමිකම් කියන පහල හල්ගස්මුල්ල, සී. වැන්දබෝනා හිමිකම් කියන මල්පුදන දෙණිය, රජය සහ එස්. සෝමපාල හිමිකම් කියන කැටලන්ද; දකුණට: ඒ. ජෝන් තුඩුගලගේ හිමිකම් කියන පහල හල්ගස්මුල්ල, සී. වැන්දබෝනා හිමිකම් කියන මල්පුදන දෙණිය, රජය සහ එස්. සෝමපාල හිමිකම් කියන කැටලන්ද; බටහිරට: මාර්ගය, අගලවත්ත වැව්ලි සමාගම හිමිකම් කියන පාන්තිය කොටස සහ ඇල.

02 – 115



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## නිවැරදි කිරීමයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

මගේ අංකය: 4-3/5/2017/HA/574.
ප්‍රා. ලේ. ගේ අංකය: DS/GFG/L&L/4/81.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 අ (1) වැනි වගන්තිය යටතේ පළකරන ලද අංක 2145/52 සහ 2019.10.18 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* සිංහල භාෂා පිටපතෙහි අංකනයෙන් සඳහන් කර ඇති දිනය ''2018.10.18'' ලෙස දෝෂ සහගතව සඳහන් කර ඇත. එය **''2019.10.18'' ලෙස නිවැරදි විය යුතුය.**

රජයේ මුද්‍රණාලයාධිපති.

2019 දෙසැම්බර් මස 18 වැනි දින.

02 – 129

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.